# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි: 01/2018

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2018.11.13

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>වැටුප් ගෙවීම සඳහා සේවක ලැයිස්තුව තහවුරු කිරීම</u>**

වැටුප් ගෙවීමට පෙර සේවකයන්ගේ ලැයිස්තුව තහවුරු කිරීම සම්බන්ධයෙන්, කෝප් කමිටුවේ නිරීක්ෂණ මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සලකා බලා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2018.09.20 දින පැවති සිය 995 වැනි සභාවාරයේ දී, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පහත දැක්වෙන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

I. උසස් අධ්‍යාපන ආයතනවල මූල්‍යාධිකාරී/මූල්‍ය අංශය විසින් එක් එක් දෙපාර්තමේන්තු/අංශවල සේවක ලැයිස්තු, මාසයේ පළමු වැඩකරන දිනයේ දී එම අදාල දෙපාර්තමේන්තු/අංශ ප්‍රධානීන් වෙත බෙදා හැරිය යුතුය.

II. අදාළ මාසයට නියමිත සේවක ලැයිස්තුව අදාළ දෙපාර්තමේන්තු/අංශ ප්‍රධානියා විසින් තහවුරු කර එම අදාළ මාසයේම 10 වන දිනට හෝ ඊට පෙර මූල්‍යාධිකාරී/මූල්‍ය අංශය වෙත ලබා දිය යුතුය.

III. එක් එක් දෙපාර්තමේන්තු/අංශවල වැටුප් ගෙවීම සඳහා සේවක ලැයිස්තුව තහවුරු කිරීම එම අදාළ දෙපාර්තමේන්තු/අංශවල ප්‍රධානීන්ගේ වගකීමක් වන්නේ ය.

IV. වෙනස්කම් පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඒ පිළිබඳව ප්‍රමාදයකින් තොරව දැනුම් දිය යුතුය.

V. කිසියම් විෂමතාවයක් හෝ වැඩිපුර මුදල් ගෙවීමක් සිදු වී ඇත්නම්, ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට මූල්‍යාධිකාරී විසින් අදාළ පාලන අධිකාරිය වෙත වහාම දැනුම් දිය යුතුය.

VI. වැටුප් ගෙවීමට අදාල සනාථයන් මූල්‍ය අංශය විසින් ලබා ගත යුතුය.

ඉහත ක්‍රියාවලිය සඳහා අදාළ වන ආකෘතිය අමුණා ඇත.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කළේ : මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

(අ.පි.බ)

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
11. විශ්වවිද්‍යාලවල/ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
13. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
14. විශ්වවිද්‍යාලවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/සහකාර අභ්‍යන්තර විගණකවරුන්
15. විගණකාධිපති
16. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
17. වෘත්තීය සමිති ලේකම්වරුන්

ලිපි ගොනු අංක: යූ.ජී.සී./සී.අයි.ඒ/එෆ්/අයි.ඒ චක්‍රලේඛ /1

## අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීම සඳහා සේවක ලැයිස්තුව තහවුරු කිරීම

විශ්වවිද්‍යාලය/ආයතනය :..............................................................................

පීඨය/දෙපාර්තමේන්තුව/අංශය :..............................................................................

මාසය සහ අවුරුද්ද :..............................................................................

| අනුක්‍රමික අංකය | සේවක අංකය | නම | තනතුර |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

සටහන

අදාළ මාසය තුළ අධ්‍යයන/අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ වෙනස් වීම් තිබේ නම්, ප්‍රකාශ යටතේ සඳහන් කළ යුතුය.

ප්‍රකාශ

......................................................................................................................................................................

......................................................................................................................................................................

.........................................................................................

**ඉහත සඳහන් ලයිස්තුවේ නම සඳහන් සෑම අධ්‍යයන/අනධ්‍යයන සේවකයෙක්ම මගේ පීඨයේ/දෙපාර්තමේන්තුවේ/අංශයේ සේවය කරන බවත් ඔවුන්ගේ පැමිණීම මාගේ දැනුම අනුව හා විශ්වාසයෙන් යුතුව සත්‍ය බවත් මෙසේ සහතික කරමි.**

...................................................... ..................................

දෙපාර්තමේන්තු/අංශ ප්‍රධානී දිනය

---

මුල්‍යාධිකාරී,

විශ්වවිද්‍යාලය/ආයතනය..................................................................

වැටුප් ගෙවීම නිර්දේශ කරමි/නොකරමි.

............................................. ...................................

පීඨාධිපති දිනය